# 2017 අගෝස්තු මස සාංඝික පවුල් දින සුපුවත
# "ඔබ වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අපට හෙළි කළ මැනව"
# 1 වන කොටස

පුබුදු ගී අංක 131 "පුරා හදවතින් ......."

01. i මෙවර ශුද්ධාත්ම රැළියේ තේමා දේශනය හරහා දෙවියන් වහන්සේගේ කැමැත්ත පිළිබඳව බොහෝ දේ එළිදරව් කරනු ලැබිණි. මේ එළිදරව් කිරීමට අනුව දෙවියන් වහන්සේගේ කැමැත්ත සෙවීමටත්, ඒ අනුව මේ වසර පුරාම ජීවත් වීමටත් සමිඳාණන් වහන්සේගේ මගපෙන්වීම සහ බලය අපට ලැබෙන බව නියතයි.

ii ශු.මතෙව් 6:9-10 කියවන්න.
මේ සමිඳාණන් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාවේ මුල් කොටසයි. මෙම යාච්ඤාව උච්චාරණය කරන අපට හැඟෙන්නේ සමිඳාණන් වහන්සේ ද එලෙසම යාච්ඤා කරන්නට ඇති කියාය. එලෙසම "ඔබගේ කැමැත්ත සිදුවේවා" කියා යදින විට "ඔබගේ ශුද්ධවූ කැමැත්ත මට හෙළි කළ මැනව" කියාද නිතර නිතර යදින්නට ඇත.

02. i අප එකිනෙකා පිළිබඳව දෙවියන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත සහ සැලැස්ම එදිනෙදා සිද්ධි හරහා අනාවරණය වනු ඇත. ශුද්ධාත්ම ආලෝකය තුළ සිද්ධි වලට ගැඹුරින් අවදි වෙන විට එය අපට පැහැදිලි වේ.

ii අප එකිනෙකාට තම තමා ගැන හා තමාගේ අනාගතය ගැන සැලැසුම් ඇත. එලෙසම තම දරුවන් ගැන සැලසුම් ඇත. බොහෝ දෙනා මේ සැලසුම් ඉටු කර ගැනීමට උපරිම වෙහෙස දරති. මුදල් වැය කරති. මේවා ඉතාම උසස්ම සැලසුම් යයි සිතති. ඒ වෙනුවෙන් යාච්ඤා කරති.
මේ සැලසුම් බිඳ වැටෙන විට දුක් වෙති. කලකිරෙති.

iii දෙවියන් වහන්සේටද අප එකිනෙකා ගැනද, අප දරුවන් ගැනද සැලැසුමක් ඇත. දෙවියන් වහන්සේට අප ගැන ඇති සැලසුමට වඩා උසස් සැලසුමක් කාටවත් සකස් කළ නොහැක. ඔවුන් වහන්සේගේ සැලසුම් අසම සමය. එම සැලසුමට වඩා උසස් සැලසුමක් කාටවත් නිර්මාණය කළ නොහැකි නිසා, එම දේව සැලසුම නොහොත් දේව කැමැත්තට අවනත වීම අප අපටත්, අප දරුවන්ටත් කරන උපරිම යහපතය.

iv එමනිසා අපගේ ජීවිතයේ සෑම සිද්ධියකදීම එනම් පවුල් ප්‍රශ්න ඇති වෙද්දී, ආර්ථික අගහිඟකම් ඇති වෙද්දී, දරුවන්ගේ ප්‍රශ්න ඇති වෙද්දී, අසනීප තත්ත්වයන් එද්දී සහ නොයෙකුත් තාඩන පීඩන මැද "ඔබගේ කැමැත්ත සිදුවේවා" කියා කියන්නට අපට හැකිද? ඒ සෑම සිද්ධියකදීම සමිඳාණෝ අප සමඟ බව ඔබට විශ්වාසද? මෙවැනි විශ්වාසයක් ඇතිව දේව කැමැත්තට අවනත විය හැක්කේ ශුද්ධාත්මයාණන්ට නිතර අවදි වෙන කෙනෙකුට පමණ ය. එවැනි කෙනෙකුට පමණය දේව කැමැත්තට "ආමෙන් " කියා කිය හැක්කේ.

03. 2021 වර්ෂය පුබුදුව ආරම්භ වී අවුරුදු 50 ක් ගත වෙන රන් ජුබිලි වර්ෂයයි. රන් ජුබිලිය කියන්නේ දේව වචනයට අනුව වරප්‍රසාදයේ මොහොතකි; යලි සිත් හැරීමේ මොහොතකි. එම නිසා එම අවුරුදු 4 මනස්ථාපනය සඳහා යොමුවන කාලයක් ලෙස අපට ඉදිරිපත් කර ඇත. මෙම කාලය මනුෂ්‍ය මට්ටමින් උත්සව පවත්වන කාලයක් නොවේ. අපගේ අභ්‍යන්තරයෙන්ම හැරෙන පිණිස සමිඳාණන් විසින්ම දී ඇති කාලයකි. ස්වර්ගයට ඇතුළුවීමේ පළමු වෙනි යතුර මනස්ථාපනයයි.
මනස්ථාපනය වෙන හැම මොහොතකම දෙවියන් වහන්සේ අපව පවිත්‍රතාවයට රැගෙන යනවා. මාව පවිත්‍ර කරනු ලබන හැම මොහොතකම මා වෙත ස්වර්ගීය බලයක් ගලාගෙන එනවා. මනුෂ්‍ය බලයට කරන්නට බැරි දේ දෙවියන් වහන්සේ මා තුළ කරන්නට පටන් ගන්නවා. සමිඳාණන් වහන්සේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරනවාත් සමඟ කිව්වේ, 'මනස්ථාපනය වන්න; මක්නිසාදයත් ස්වර්ග රාජ්‍යය ආසන්නය" කියාය.

## දෙවෙනි කොටස - ශුද්ධවර ජුසේ වාස් මෙහෙයුම

මෙවර ශුද්ධාත්ම මංගල්‍යය දිනයේදී මේ වසර ශුද්ධවර ජුසේ වාස් පියතුමාගේ වසර හැටියට ප්‍රකාශ කරනු ලැබුවා. ශුද්ධවූ සභාවද මේ වසර ශුද්ධවර ජුසේ වාස් පියතුමාට කැප කර ඇත. ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ජුසේ වාස් මෙහෙයුම පිළිබඳව අනාවරණය කරන්නට ඇත්තේ එමනිසා විය හැක.

ශුද්ධවර ජුසේ වාස් තුමාගේ මෙහෙයුම වනාහි එතුමාණන්ට යාච්ඤාව තුළ අනාවරණය වුනාවූ දේව කැමැත්ත තුළ සැලසුම් කරන ලද ක්‍රියාවලියකි. එතුමාගේ ජීවිතය තුළ අපට දකින්නට ඇත්තේ පුදුමාකාර ලක්ෂණ කිහිපයකි. ක්‍රිස්තු සුභාරංචිය රැගෙන යන සැමට මේ ලක්ෂණ තිබිය යුතුමය. ශු.ජුසේ වාස් තුමාව ශුද්ධවරයට ඔසවද්දී ශුද්ධවූ සභා මාතාව එතුමාගේ සුවිශේෂ ලක්ෂණ කීපයක් උලුප්පලා ගත්හ.

### 01. උන්වහන්සේගේ සරල අල්පේච්ඡ ජීවිතය :

දිළිඳුව ජීවත් වීමට විශාල පරිශ්‍රමයක් යෙදූ එතුමා සැම විට සිතුවේ ජේසු සමිඳාණන්ගේ ජීවිත ක්‍රමය තමයි දිළින්දෙක් ලෙස ජීවත්වීම බව. එම නිසා එතුමා දිළිඳුව ජීවත් වීමට දැඩි තීරණයක් ගත්තේය.

සරල අල්පේච්ඡ ජීවිතය පුබුදු ජනතාවට අළුත් දෙයක් නොවේ. පුබුදුවේ නිර්මාතෘතුමා වන ස්වාමි තාත්තා හරහා දෙවියන් වහන්සේ මෙය අපට අනාවරණය කර ඇත. ස්වාමි තාත්තා සරල ජීවිතය ගැන අපට කිව්වා පමණක් නොව එය තම ජීවිතයෙන්ම පෙන්වා දී ඇත. එතුමා ජීවත් වන්නේ කුඩා පැල්පතකය. බිත්ති කටු මැටි ගසා සාදා ඇත. වහලය පොල් අතු වලින් සෙවිලි කර ඇත. පොළොව ගොම ගා සකස් කර ඇත. නිර්මාතෘතුමා තුළින් දෙවියන් වහන්සේ ඔවුන් වහන්සේගේ සිත අපට අනාවරණය කර ඇත.

### 02. ශු ජුසේ වාස් තුමාගේ දිළිඳුන් උදෙසා වැය වීම :

ශුද්ධවර ජුසේ වාස් පියතුමා දිළිඳුන් උදෙසා වැය වුනා. ජීවත් වුනේ දිළිඳු අය සමගයි. ආශ්‍රය කළේ සමාජයෙන් කොන් වූවන්වයි. එතුමා ජීවත් වුනු ආකාරය ඔවුනට බලපාන්න පටන් ගත්තා. එතුමා දිළිඳුන්ගේ මිත්‍රයෙක් වුනා.

කිතු දන පුබුදුවේ අපට මෙය අළුත් දෙයක් නොවේ. 1989 ශුද්ධාත්ම රැළියේ තේමාව වූයේ "දිළිඳුන්ගේ සභාව වෙමු අපි" යන්නයි. එහිදී අපට ලැබුණ අනාවරණය නම් දිළිඳු අයව සොයා යාම පමණක් නොව පව්කාරයන්ව, සමාජයෙන් කොන් වූවන්ව සොයා ගොස් ඔවුන් ආශ්‍රය කරන්නටයි. එලෙස ඔවුන්ට ආදරය දැක්වීම තුළ ඔවුන් ස්වාමින් වහන්සේට ළං කිරීමයි. දිළිඳුන් කොන් වූවන් සොයා යන මෙහෙයුම අපට අමාරු දෙයක් නොවේ.

### 03. දිව්‍ය සංරක්ෂණය කෙරෙහි ජුසේ වාස් පියතුමාට තිබුණ විශ්වාසය :

දේව සංරක්ෂණය කෙරෙහි පුදුමාකාර විශ්වාසයක් එතුමාට තිබුණා. තමන්ගේ ජීවිකාව සඳහා අවශ්‍ය කරන සෑම දෙයක්ම අහසේ පියාසර කරන පක්ෂීන් රැකබලා ගන්න දෙවියන් වහන්සේ දෙන බව එතුමා තදින් විශ්වාස කෙරුවා. උතුරේ දිට දකුණටත්, කඳුකරයටත් හිස් පතුලෙන්ම කැළෑබද පෙදෙස් හරහා පයින්ම ගමන් කළේ කිසිම මනුෂ්‍ය මට්ටමේ සුරක්ෂිතභාවයක් නොමැතිවයි. තමා රැය ගත කරන්නේ කොතැනද? ආහාරයට ගන්නේ කුමක්ද? අඳින වස්ත්‍රයක් ලබා ගන්නේ කොතනින්ද? යන්න එතුමා ප්‍රශ්නයක් කර ගත්තේ නැත.

### 04. ජුසේ වාස් පියතුමා නිරන්තරයෙන්ම අන් අයට අභියෝගයක් වුනා :

ජුසේ වාස් පියතුමා අන් අයට අභියෝගයක් වුනේ තම ජීවිතයෙන්මයි. තම ජීවිත පැවැත්ම ක්‍රිස්තු සිතට අනුව හැඩගස්වාගෙන අන් අයට ආදර්ශයක් වුනා. තම සරල අල්පේච්ඡ ජීවිතය, අසරණයින්ට දක්වන ලද කරුණාව, දයාව සහ තම ජීවිතය පවා පරදුවට තබමින් රෝගාතුර වූවන්ට උපස්ථාන කිරීම යනාදිය ජනතාවට බලපෑවා. එතුමා අන් අයට අභියෝග කරමින් නොගොස් තමාම අභියෝගයක් වුනා. බෞද්ධයෝ පවා උන්වහන්සේ දෙස බලා පුදුම වුනා. ඔවුන් කතෝලික ආගම වැළඳ ගැනීමට පෙළඹුනා.

ශු.ජුසේ වාස් පියතුමා අපටද අභියෝගයකි, ආදර්ශයකි. මුළු ලංකාවේම දූත සේවයේ යෙදෙන්නට සිටියේ එකම පියතුමෙක් පමණකි. අප දෙස බලා කී දෙනෙක් සත්‍ය විශ්වාසය වැළඳ ගෙන ඇද්දැයි සිතීම වටී. අප ජීවිතය දෙස බලා කතෝලික කී දෙනෙක් පුබුදු ගමනට ඇතුල් වී ඇද්ද? සිතා බලන්න.

**05. සාකච්ඡාවට :**

i පසුගිය කාලයේදී දියත් කරන ලද සමරිතානු මෙහෙයුම ඔබ සංඝය තුළ කොතෙක් දුරට ක්‍රියාත්මක වුනාද?

ii පසුගිය ශුද්ධාත්ම රැළියට අළුත් අය කී දෙනෙකුව ඔබ පෞද්ගලිකව රැගෙන ගියාද?

iii සමරිතානු මෙහෙයුම සඳහා ලැබුන දේව වචනය ඔබ ලිහිල් කොටද සැලකුවේ?

iv බාධා මැඩගන්නට ඔබ ගත් උපාය මාර්ග මොනවාද?

v ලන්දේසි පීඩනය මැද, තමාව මරන්නට පවා ලන්දේසි සොල්දාදුවෝ සොයන විට උපාය මාර්ග යොදමින් තම දූත කාර්යය දිගටම කරගෙන ගිය ජුසේ වාස් පියතුමා එසේ කළේ කෙලෙසදැයි සාකච්ඡා කරන්න.



ඔබගේ අතපසුවීම ගැන කුඩා කණ්ඩායම තුළ මනස්ථාපනයකට ඇතුළු වන්න. සමරිතානු මෙහෙයුම නතර නොකර දිගටම කරගෙන යෑමට පියවර ගන්න. සමරිතානු මෙහෙයුමට වුනු අතපසුවීම ජුසේ වාස් මෙහෙයුමට වීමට ඉඩ නොතබන්න.

**06.** පුබුදුව ජුසේ වාස් මෙහෙයුමද දැන් ආරම්භ කර ඇත. දේව සංරක්ෂණය කෙරෙහි විශ්වාසය තබමින් දේව රාජ්‍යය සඳහා රටේ විවිධ තැන්වලට ගොස් වැඩ කරන්නට ඔබගේ ජීවිතය සම්පූර්ණයෙන් දෙන්නට ඔබ කැමතිද? සමිඳාණන් වහන්සේ ඔබව ස්පර්ශ කළහොත්, දේව සංරක්ෂණය කෙරෙහි පූර්ණව යැපෙන්නට හැකිනම් ඉදිරිපත් වන්න. මෙය ඔබට ජීවත් වීමට රැකියාවක් නොවේ. මුදල් හදල්, ඉඳුම් හිටුම් ගමන් බිමන් වලට පහසුකම් සොයනවා නම් මෙය ඔබට නොගැලපේ.

අප රටේ දකුණේ 1%ක්වත් කතෝලිකයින් නැති ප්‍රදේශ ඇත. නුවර ප්‍රදේශය,ගාල්ල ප්‍රදේශය මඩකලපුව, මන්නාරම, යාපනය, මහියංගනය සහ බදුල්ල වැනි දුරස්ථර ප්‍රදේශවල දේව රාජ්‍යය සඳහා වැඩ කරන්නට ඔබ කැමතිද? ඔබ අභියෝගයක් වෙන්නට කැමතිද? ඔබ දේශනා කරන දේ ජීවත් විය යුතුය.

ශු.ජුසේ වාස් පියතුමා හිරගෙදර සිටි කාලයේදීත් එතුමාගේ ජීවිතය සෙසු හිරකාරයින්ටත්, සොල්දාදුවන්ටත් බලපෑවේය. මෙතුමා ශුද්ධවරයෙක් කියා රජතුමාට පැහැදිලි විය. ඉඩෝරය නිසා වියළී ගිය රටට වැස්ස ඉල්ලා දෙවිඳුන්ට යදින ලෙස රජු එතුමාගෙන් ඉල්ලුවේය. දේව මහිමය මුල් කරගෙන ජුසේ වාස් පියතුමා කරන ලද යැදුමත් සමඟ වැස්ස ලැබුණි.

ශු.ජුසේ වාස් පියතුමා දුක් විඳිමින්, අගහිඟකම් අත්දකිමින්, මරණ තර්ජන මැද්දේ බාධා අභියෝග මැඩගෙන උපාය මාර්ග යොදමින් දේව රාජ්‍යය සඳහා වැය විය.

**07.** ඔබත් දේව රාජ්‍යය සඳහා කැපවෙන්නට කැමතිද? දේව සංරක්ෂණය කෙරෙහි පමණක් යැපෙමින් රාජ්‍යය සඳහා කැප වෙන්නට කැමතිද?

පහත සඳහන් කර ඇති දූත කාර්යන් සඳහා ඔබ කැමති නම් ඉදිරිපත් විය හැක.

1. පවුලක් හැටියට පූර්ණකාලීනව දූත සේවාවට සම්බන්ධ වීම.
2 අනගාරිකව කියන විවිධ දුෂ්කර තැන්වලට එම ප්‍රදේශ බලා ගැනීමට යෑම.
3. දුරස්ථර ප්‍රදේශවල එක ප්‍රශංසා ගමක් බාර ගෙන බලා ගැනීම.

ශු.ජුසේ වාස් මෙහෙයුම සඳහා අපව ආලේප කරන මෙන් එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරමු.
පුබුදු ගී අංක 113 "බාධක පීඩා ගැරහුම් පිළිගෙන....."

*************************